Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පරිපාලනය තුළ ග්‍රාම නිලධාරීවරයාගේ බලතල සහ කාර්යයන්

***ඊ.ඩබ්.ඒ.කේ සඳමාලි [1]***
***ආචාර්ය චාමින්ද අබේසිංහ [2]***

සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ පරිපාලන ව්‍යූහය තුළ බිම් මට්ටම නියෝජනය කරනු ලබන, ග්‍රාම නිලධාරින්ගේ සේවය බොහෝ විට ඇගයීමට සහ විවේචනයට බඳුන් වී තිබේ. ගම් මට්ටමේ කටයුතු කරන රජයේ ප්‍රමුඛ නිලධාරියා ග්‍රාම නිලධාරියා වේ. රජයත් මහජනයාත් අතර සම්බන්ධීකරණ නිලධාරියෙකු වශයෙන් ද, ප්‍රාදේශීය පාලනය සහ රජයේ සංවර්ධන ක්‍රියාදාමය ගම් මට්ටමින් ක්‍රියාත්මක කරන රජයේ මෙන් ම පළාත් සභාවේ නියොජිත වශයෙන් ද කටයුතු කරන ග්‍රාම නිලධාරිවරයා වර්තමානයේ බහුකාර්ය තත්ත්වය උසුලයි. මෙම කාර්යයන් ඉටු කිරීමේ දී ඔහු නීතිමය මෙන්ම සමාජීය සහ සදාචාරාත්මක බැඳීම්වලට යටත් වේ. බහුකාර්ය නිලධාරියෙකු වන ඔහුගේ කාර්යභාරය මූලික  වශයෙන් මෙසේ දැක්විය හැකි ය. එනම්, තම කොට්ඨාශයේ නීතිය සහ සාමය රැකීමේ කටයුතු, ව්‍යවස්ථාපිත අණ පනත් ක්‍රියාත්මක කිරීම, සමාජ සුභසාධන කටයුතු පවත්වාගෙන යාම සහ ග්‍රාමීය මට්ටමේ සියලු සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සහ මෙහෙය වීමයි. මීට අමතරව ව්‍යවස්ථාපිත බලතල රැසක් ග්‍රාම නිලධාරීවරයාට පැවරී තිබුණ ද එම බලතල සහ වගකීම් ක්‍රියාත්මකභාවයේ දී සීමා වී තිබෙන්නේ ද? යන්න මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වේ. එසේ ග්‍රාම නිලධාරිවරයාගේ බලතල සහ කාර්යයන් සීමා වී තිබේ ද? එසේ වීමට බලපෑ හේතු මොනවාද? යන්න හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණු ලෙස පෙන්වාදිය හැකි ය. මෙම ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නියැදිය ලෙස තෝරාගත් අතර එහිදී අධ්‍යයන නියැදියට අහඹු ලෙස තෝරාගත් ග්‍රාම නිලධාරීවරුන් 25 ක් සහ ප්‍රදේශවාසින් 25 ක් ඇතුළත්වන පරිදි, ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත සපයා ගන්නා ලදි. එමෙන්ම ලබාගත් ඇතැම් තොරතුරු නිරීක්ෂණ මෙන් ම මූලික තොරතුරු සපයන්නන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා තුළින් තහවුරු කර ගැනිණි. මෙම අධ්‍යයනයේ ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයට Ms Excel මෘදුකාංගය භාවිත කරන ලදි. අධ්‍යයනයේ මූලික සොයා ගැනීම්වලට අනුව පැහැදිලි වන්නේ ග්‍රාම නිලධාරීවරයාගේ බලතල සහ කාර්යයන් විවිධ හේතු සාධක මත සීමා වී ඇති බවයි. එහිදී හඳුනාගත් එක් සාධකයක් අතර දේශපාලන මැදිහත් වීම මත ග්‍රාම නිලධාරීවරයාගේ බලතල සීමාවන බවට 60% ප්‍රතිශතයක් ග්‍රාම නිලධාරින් ද 44% ක ප්‍රතිශතයක් ප්‍රදේශවාසීන් ද එකඟත්වය පළකර තිබීම මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය.

ප්‍රමුඛ පද ඃ ග්‍රාම නිලධාරී, පරිපාලන විමධ්‍යගතකරණය, පලාත් පරිපාලනය, ස්වදේශ කටයුතු, ග්‍රාමීය පරිපාලනය

*1 දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* kanchansanda@gmail.com

*2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*